# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## **බෞද්ධ ශිෂ්ටාචාරය** - 12 ශ්‍රේණිය

සැකසුම - **රත්නපුර අධ්‍යාපන කලාපය**

**තිළිණ ජයවර්ධන** - ර/මල්වල මහා විද්‍යාලය

### 7 වන සතිය

**01.** විශාකාව රාජකාරාමය කරවා පූජා කළහ. (...)

**02.** ත්‍රිපිටක පර්යාප්තිධර සිව්පිළිසිඹියාපත් රහතුන් එකුන් පන්සිය නමක් ප්‍රථම සංගීතියට තෝරා ගත්හ. (...)

**03.** ඇතැම් අවස්ථාවල දී කාන්තාව පිරිමියාට වඩා බුද්ධිමත් බව කොසොල් රජුට දේශනා කළහ. (...)

**04.** ශුද්‍රයන්ට ද්විජ තත්වය හිමි නොවීය. (...)

**05.** බ්‍රාහ්මණයෝ කාන්තාවට ආගමික කටයුතු තහනම් කළහ. (...)

**06.** චතුරංගනී සේනාවේ ප්‍රධානියා සෙන්පති නැතහොත් සෙනානි විය. (...)

**07.** ආනන්ද හිමියන්ට එල්ල වූ චෝදනා ද පළමු සංගීතියට හේතු විය. (...)

**08.** බුදුරදුනට යව ආහාර දානයට ලැබුනේ 12 වන වස් කාලයේදීය. (...)

**09.** චින්චිමානවිකාවගේ කථාවස්තුව ධම්මපදට්ඨ කථාවේ දැක්වේ. (...)

**10.** මැදිරිගිරියෙහි දක්නට ලැබෙන්නේ වටදාගෙයකි. (...)

**11.** මහමෙව්නා වෙහෙර ලෙස හැඳින්වූයේ මහා විහාරයයි. (...)

**12.** චීන ජාතික පාහියන් මහා විහාරයෙහි ඉගෙන ගෙන තිබේ. (...)

**13.** බුරුමයේ පගාන් අගනුවර කරගත්තේ සුයිකෝ රැජිණයි. (...)

**14.** දහම් ගුණ පාඨයේ සඳහන් ඒහි පස්සිකෝ යනු ඒහි භික්ෂු පබ්බජ්ජාවයි. (...)

**15.** රේවත සම්භූත යන හිමිවරු දෙවන සංගීතියට සම්බන්ධවේ (...)

**16.** ධම්ම පදට්ඨ කථාව මුල්කොට ගෙන සද්ධර්ම රත්නාවලිය ලිය වී තිබේ. (...)

**17.** මැදිරිගිරියෙහි දක්නට ලැබෙන්නේ සුවිශාල වටදාගෙයකි (...)

**18.** ඝණ්ටාකාර ආකෘතිය කතරගම කිරිවෙහෙරෙහි දක්නට ලැබේ (...)

**19.** පොළොන්නරුවේ උත්තරාරාම විහාරය මහා පරාක්‍රමබාහු රජු විසින් ඉදිකරන ලදී. (...)

**20.** වළගම්බා රජු අභයගිරිය කරවා තිබේ. (...)

**21.** පණ්ඩුවාසදේව මෙරට වසර 30 පමණ පාලනය කර තිබේ. (...)

**22.** පද්මාකාර ආකෘතියේ සෑය ලංකාවේ බහුලව දක්නට ලැබේ. (...)

**23.** පඤ්චසතිකා නමින් හඳුන්වන්නේ තෙවන සංගීතියයි. (...)

**24.** හියුං සියැං නම් චීන ජාතික භික්ෂුව මහාවිහාරයේ ආභාෂය ලබා තිබේ. (...)

**25.** මිහදු හිමියන් සමග මෙරටට පැමිණි ගණන 10 කි. (...)

**26.** ෂිංටෝ ආගම පැරණි තායිලන්තයේ පැවතුනි. (...)

**27.** සෝනුත්තර ලෙස හැඳින්වූයේ ජපන් රජ පවුලයි (...)

**28.** ස්ථූපයක කොත්කැරැල්ලෙන් නව අංග සත්‍ථුසාසනය නිරූපන කරයි. (...)

**29.** බුදුරදුන් පස්වග මහනුන්ට අනන්තලක්ඛන සූත්‍රය දේශනා කළහ. (...)

**30.** සියලු දෙව් මිනිසුන්ට ගුරුවරයෙකු වීම නිසා බුදුරදුන් සත්ථා දෙව මනුස්සානං වේ (...)

**31.** වැසි සමයෙහි පැවති දුෂ්කරතාවයන් බිම්බිසාර රජුගේ ඉල්ලීමට අනුව බුදුරදුන් වස් විසීම අනුමත කළහ. (...)

**32.** බුදු සමයේ පෝෂණයට හා ව්‍යාප්තියට බිම්බිසාර රජු ක්‍රියා කළහ. (...)

**33.** සාති භික්ෂුව භවගාමී විඤ්ඤාණය ඉදිරිපත් කළහ. (...)

**34.** පළමු සංඝායනාවෙන් පසුව ධර්මය විනය ආරක්ෂා කිරීමට භානක පරම්පරාවලට පැවරීය. (...)

**35.** අශෝක රජු මෙරටට අටලොස් කුලයක ශිල්පීන් එවනලදී (....)

**36.** ග්‍රීෂ්ම ඍතුවේදී ගිනිමැල හතක රශ්නයෙන් කල් ගෙවූයේ වානප්‍රස්ථ ආශ්‍රමයේදී ය. (...)

**37.** දන් පිළිගැනීම බ්‍රාහ්මන කුලයට ද කළ හැකිවිය. (...)

**38.** ආපද්ධර්ම උසස් කුල 3 ටම හිමිවිය. (...)

**39.** මාතුපෝසක ජාතකයෙන් මවට සැලකීමේ ගුණය පෙන්වයි. (...)

**40.** අජාසත්ත රජු වජ්ජි ජනපදය ද මගධයට යටත් කර ගත්හ. (...)

**41.** ක්ෂත්‍රියන් මහා බ්‍රහ්මයාගේ ........................ උපත ලැබීය.

**42.** බුදුරදුන් පූර්වාරාමයෙහි වස්කාල ........................ ගත කළහ.

**43.** මගධයෙහි අගනුවර ...................................... විය.

**44.** ඍධිමත් භික්ෂූන් අතර අග්‍රස්ථානය .............................. තෙරුණ්ට හිමි විය.

**45.** මගධය වටා පංචමහා පර්වත පැවති නිසා .......................... ලෙස හඳුන්වයි.

**46.** දෙවන ධර්ම සංගායනාව රහතුන් 1000 සහභාගි විය. (...)

**47.** මගධයට අයත් ගම් 80,000 සහ යොදුන් 8000 විය. (...)

**48.** වෛදික යුගයෙහි බ්‍රාහ්මණයන් කාන්තාවට පැවිද්දට අවසර දී තිබුණි. (...)

**49.** දෙවන සංගායනාවට රජගහනුවර සප්තපර්ණි ගුහාවෙහි පැවැත්වීය. (...)

**50.** කෝසල රාජ්‍යයෙහි දෙව්රම් වෙහෙර පිහිටා තිබුණි. (...)

**51.** තෙවන සංගායනාවේ මූලිකත්වය ............ තෙරුන් දරන ලදී.

**52.** ධර්මධර විනයධර ප්‍රශ්නය ඇති වූයේ ...................... නම් ආරාමයේ ය.